පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව
රත්නපුර දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශය 2014 මාර්තු 28 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 27 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 සැප්තැම්බර් 24 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම
--------------------------------------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත අංක 01 හි 21 ඡේදයට අනුව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතු වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සාරාංශයක් ඇතුළත් සටහන් ඉදිරිපත් කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේදී කල්බදු වාරික ගෙවීම යටතේ අත්පත් කරගත් කැබ් රථයට අදාලව ගෙවන ලද රු. 5,955,357 ක් ප්‍රාග්ධනිත කර තිබියදී, 2013 වර්ෂයේ ගිණුම් තුලින්ද නැවත උක්ත රථයේ සත්‍ය වටිනාකම වන රු. 6,670,000 ක් ප්‍රාග්ධනිත කර තිබුණි. එබැවින් මෝටර් රථ හා කරත්ත ගිණුම සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායක වීමේ ගිණුමේ ශේෂ රු. 5,955,357 ක් වැඩියෙන් දක්වා තිබුණි. තවද, උක්ත රථයට අදාලව 2013 දෙසැම්බර් 31 දිනට කල්බදු ආයතනයට ගෙවිය යුතු පොළිය රු. 701,462 ක් සහ එකතු කල අගය මත බදු වටිනාකම වූ රු. 409,422 ක් හඳුනාගෙන තිබුණද, එය ගිණුම් වලට ගෙන නොතිබුණි.

(ආ) 2014 වර්ෂය තුලදී ගෙවීම් කරන ලද සමාලෝචිත වර්ෂයට අදාල වූ එකතුව රු. 251,946 ක වියදම් සඳහා ණයහිමියන් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබූ බැවින් සමාලෝචිත වර්ෂයේ වියදම එකී ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ තථ්‍ය උසාවි දඩ ආදායම රු. 1,032,166 ක් වූ අතර, ඒ තුල හිඟ ආදායම ලෙස රු. 615,916 ක් හඳුනාගෙන තිබියදී සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ බිල් කල ආදායම ලෙස රු. 2,500,000 ක් දක්වා එම අගයම 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. මේ

හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ ආදායම රු. 1,467,834 ක් හා වර්ෂය අවසානයට ණයගැති ශේෂය රු. 1,884,084 කින් වැඩියෙන් දක්වා තිබුණි.

1.3.3 නොසැසඳූ පාලන ගිණුම්

-----------------------------

ගිණුම් විෂයයන් 07 කට අදාලව 2013 දෙසැම්බර් 31 දිනට පාලන ගිණුම අනුව එකතුව රු. 23,514,801 ක්වූ අතර, උපයෝගී ලේඛණ අනුව ශේෂයන්ගේ එකතුව රු. 11,521,282 ක් වූයෙන් වෙනස රු. 11,993,519 ක් විය.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

-------------------------------------

පොදු ගබඩා ගිණුමට හා ප්‍රිමික්ස් ව්‍යාපෘති පොදු ගබඩා ගිණුම අනුව රු. 480,930 ක වත්කම් ශේෂයක් ශේෂ පත්‍රය තුල දිගුකාලීනව දක්වා තිබුණද, ඒ පිළිබඳ භෞතික ශේෂයක් හෝ හඳුනාගැනීම සඳහා කිසිදු ලේඛණයක් හෝ විගණනය සඳහා ඉදිරිපත් නොවුණි.

1.3.5 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

-----------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව. | අනුකූල නොවීම්. |
|---|---|---|
| | ------------------------------------------ | ------------------- |
| | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (I) | මුදල් රෙගුලාසි අංක 371(2) | අවස්ථා 05 කදී විවිධ කාර්යයන් උදෙසා නිකුත් කරන ලද රු. 93,000 ක අත්තිකාරම් විගණිත දිනය වනවිටත් පියවා නොතිබුණි. |
| (II) | මුදල් රෙගුලාසි අංක 502 හා 11 පරිශිෂ්ඨය | රු. 38,111,235 ක වටිනාකමින් යුත් ස්ථාවර වත්කම් ශේෂය තහවුරු කර ගැනීම සඳහා විස්තරාත්මක ස්ථාවර වත්කම් ලේඛණ නොතිබුණි. |
| (III) | මුදල් රෙගුලාසි අංක 570 සහ 571 | තැන්පත් ලේඛණය අනුව 2007 වර්ෂයේ සිට මාස 06 ක් ඉක්ම වූ රු.2,680,074 ක තැන්පත් පිළිබඳව කටයුතු කර නොතිබුණි. |

1.3.6 අවිධිමත් ගනුදෙනු

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය ශීර්ෂ 101 යටතේ සලසා තිබූ රු. 7,596,600 ක ප්‍රතිපාදනය ඉක්මවා රු. 1,861,461 ක වියදම් දරා තිබුණි.

(ආ) විෂයය භාර අමාත්‍යවරයාගේ කිසිඳු පූර්ව අනුමැතියකින් තොරව 2013 මාර්තු 21 දිනැති සභා තීරණයක් මත ඉන්ධන දීමනාවෙන් වාරික වශයෙන් අයකර ගැනීමේ පදනම මත එක් සභිකයෙකුට රු. 12,000 බැගින් සභිකයින් 12 දෙනෙකු සඳහා රු. 144,000 ක් උත්සව අත්තිකාරම් වශයෙන් සභා අරමුදලින් ගෙවා තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය
-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ මෙහෙයුම් අයහාරය රු. 2,077,172 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ මෙහෙයුම් අයහාරය රු. 341,861 ක් විය.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය
--------------------------------------

පසුගිය වර්ෂයන්ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය මෙහෙයුම් අතිරික්තය සියයට 507 කින් වැඩිවී ඇති අතර, පසුගිය වර්ෂයන්ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු සහ වෙනත් ආදායම් වල වැඩිවීම ඊට ප්‍රධාන වශයෙන් බලපා ඇත.

2.3 ආදායම් පරිපාලනය
-----------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්
--------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000' | රු. '000' | රු. '000' |
| වරිපනම් හා බදු | 3,304 | 3,679 | 5,627 |
| බදු කුලී | 1,791 | 1,705 | 1,738 |
| බලපත්‍ර ගාස්තු | 1,342 | 1,275 | 4 |
| **වෙනත් ආදායම්** | 11,653 | 12,012 | 9,950 |

2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යයසාධනය
------------------------------------------

පවතින ආදායම් ප්‍රභවයන් වර්ධනය කර ගැනීමත්, නව ආදායම් හඳුනාගැනීමටත්, සුදුසු වැඩ පිළිවෙලක් සභාව සතුව නොමැති වීමත්, ආදායම් රැස්කිරීම සම්බන්ධ නිළධාරීන් සම්බන්ධයෙන් පවතින අධීක්ෂණයේ දුර්වලතා හේතුවෙන් සභාවේ ආදායම් තත්ත්වය වර්ධනය කර ගැනීම උදෙසා පවතින අවස්ථා සභාව වෙතින් මගහැරී තිබුණි.

2.3.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

--------------------------------

(අ) 2013 ජනවාරි, අගෝස්තු, සැප්තැම්බර් සහ ඔක්තෝබර් මාස සඳහා උසාවි දඩ ලෙස රත්නපුර මහේස්ත්‍රාත් අධිකරණය මඟින් සභා බල ප්‍රදේශයේ ග්‍රාම සේවා වසම් 111 ක් සඳහා රු. 28,833 ක් පමණක් හඳුනාගෙන තිබුණද, එම වර්ෂයේ ඉතිරි මාස 08 ක් සඳහා ඉහත උසාවි බල ප්‍රදේශයට අදාලව කිසිඳු උසාවි දඩ ආදායමක් හඳුනාගෙන ගිණුමගත කර නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) සභාවට ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල් මඟින් ලැබිය යුතු මුද්දර ගාස්තු 2012 නොවැම්බර් සිට 2013 මාර්තු දක්වා රු. 3,680,559 ක් ලැබී තිබුණද, 2013 මාර්තු මාසයෙන් පසු ප්‍රාදේශීය සභාවට හිමිවිය යුතු මුද්දර ගාස්තු හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.4 වරිපනම් බදු

---------------

පසුගිය වර්ෂ ගණනාවකට අදාලව වරිපනම් බදු අයවියයුතු ඒකක 5246 කින් රු. 3,173,395 ක හිඟ බදු මුදලක් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තියේ විධිවිධාන පරිදි අයකර ගෙන නොතිබුණි.

2.3.5 අක්කර බදු

--------------

ස්ථිර හෝ නිතිපතා ගොවිතැනට යටත්වූ ඉඩම් වලින් අක්කර බදු අයකරගත යුතු වුවත්, අවුරුදු 01 සිට අවුරුදු 04 ට වැඩි කාලසීමාවකට අදාලව ඒකක 118 කින් රු. 55,055 ක් හිඟ අක්කර බදු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(3) වගන්තියේ විධිවිධාන පරිදි අයකර ගැනීමට තිබුණි.

2.3.6 වෘත්තිය ගාස්තු

------------------

සභා බල ප්‍රදේශය තුල පවත්වාගෙන යනු ලබන උපලේඛනගත වෘත්තීන් 20 කට අදාලව රු. 900 සිට රු. 3,000 දක්වා ගාස්තු අයකල යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 (2) උප වගන්තිය අනුව හා ශ්‍රී ලංකා ජනරජයේ 2013 දෙසැම්බර් 20 දිනැති ගැසට් පත්‍රයේ ප්‍රකාශිත නියෝග අනුව දක්වා තිබුණද, සමාලෝචිත වර්ෂයට අදාලව එවැනි ගාස්තු අයකර නොතිබුණි.

2.3.7 කඩබදු

-----------

පළාත් පාලන කොමසාරිස්ගේ අංක 2009/01 හා 2009 මාර්තු 09 දිනැති චක්‍රලේඛ විධිවිධාන අනුව කඩකාමර බදුදීමේදී අදාල බදු ගිවිසුම් වාර්ෂිකව අළුත් කිරීමත්, එකී බදු මුදල් අවම වශයෙන් වර්ෂ 05 කට වරක්වත් තක්සේරු කිරීමක් කල යුතුය. කඩකාමර බදු දීමේදී එලෙස වාර්ෂික ගිවිසුම් අළුත් කර නොතිබූ අතර කඩකාමර බදුකරුවන් 04 දෙනෙකුගෙන් රු. 129,589 හිඟ කඩකාමර කුළිය අයකර නොතිබුණි.

2.3.8 දුරකථන කුළුණු ගාස්තු

----------------------------

සභා බල ප්‍රදේශය තුල ඉදිකරනු ලබන දුරකථන කුළුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ 2009 අප්‍රේල් 17 වන දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි V වන උපලේඛණයේ විධිවිධාන අනුව ගාස්තු අයකල යුතු වුවත්, බල ප්‍රදේශය තුල ඉදිකර තිබූ දුරකථන කුළුණු සඳහා ගාස්තු අය කිරීමක් සිදු කර නොතිබුණි. තවද, සභා බල ප්‍රදේශය තුල පිහිටුවා ඇති දුරකථන කුළුණු සම්බන්ධ කිසිඳු තොරතුරක් සභාව සතුව නොතිබුණි.

2.3.9 ව්‍යාපාර බදු

----------------

සභා බල ප්‍රදේශය තුල පිහිටා ඇති කර්මාන්ත, ව්‍යාපාර හා වෙළඳ බලපත්‍ර බදු අයකල යුතු ව්‍යාපාර හඳුනාගැනීම උදෙසා වාර්ෂික සමීක්ෂණයක් විගණිත දිනය වූ 2014 මාර්තු 27 දින වනවිටත් සිදුකර නොතිබූ අතර, බදු වලට අදාල ආදායම් ලේඛණය පවත්වාගෙන යනු ලබන්නේ සභාව වෙත එකතුවන ආදායම් පදනම් කරගෙන පමණක් බව නිරීක්ෂණය විය. තවද, පැල්මඩුල්ල නගරය හා කහවත්ත නගරයේ කොටසක්ද ඇතුලත්ව පුළුල් භූමි ප්‍රදේශයක පැතුරුණු මෙම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පවතින සියළු ව්‍යාපාර ස්ථාන වලින් ව්‍යාපාර බදු අයකර ගැනීම උදෙසා ප්‍රශස්ථ වැඩපිළිවෙලක් ස්ථාපනය වී නොතිබුණි.

2.3.10 දැන්වීම් පුවරු ගාස්තු

----------------------------

සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාව වන 1988 අගෝස්තු 23 දිනැති අංක 520/7 දරන පළාත් පාලන අතිවිශේෂ ගැසට් පත්‍රයේ IV (ආ) කොටස ප්‍රකාරව දැන්වීම් පුවරු සඳහා අනුමැතිය සභාව මඟින් ලබාගත යුතු අතර, සභාව විසින් ගැසට් පත්‍රය මඟින් පළකරන ලද ආකාරයට එයට අදාල ගාස්තුද අයකල යුතුය. සභා බල ප්‍රදේශය තුල දැන්වීම් හා බැනර් විශාල ප්‍රමාණයක් ප්‍රදර්ශනය වන බව 2013 මාර්තු 27 දින සිදුකරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ අතර, ඒ සියල්ල සඳහා ගාස්තු අය නොකරන බවත්, හුදෙක් අදාල පාර්ශව කාර්යාලයට පැමිණ සිදුකරන ගෙවීම් අයකර ගැනීමෙන් ඔබ්බට එම ගාස්තු අයකර ගැනීම උදෙසා ප්‍රශස්ථ වැඩපිළිවෙලක් සභාව සතුව නොමැති බවත්, විගණනයට නිරීක්ෂණය විය. තවද, දැන්වීම් ලේඛණයක් සභාව විසින් පවත්වාගෙන යනු නොලබන බැවින් දැන්වීම් හා බැනර් ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් සභාව විසින් අයකරගනු ලැබූ ගාස්තු පිළිබඳ ප්‍රමාණවත් හා නිවැරදි තොරතුරු සභාව සතු නොවුණි.

2.3.11 සතිපොල බදු

----------------

සභාව සතු සතිපොළ සෑම සෙනසුරාදා දිනකම පැවැත්වෙන අතර, අදාල වෙළඳසැල් වලින් ආදායම් නිළධාරීන් රු. 30 සිට රු. 130 දක්වා වූ ගාස්තු අයකරනු ලබයි. හුදෙක් ආදායම්නිළධාරවිසින් භාරදෙනු ලබන මුදල් බැංකුගත කිරීමෙන් ඔබ්බටමෙමක්‍රියාවලියවගකිවයුතු නිළධාරියෙක් විසින් අධීක්ෂණය කරන බවට කිසිඳු තොරතුරක් විගණනයට ඉදිරිපත් නොවිය.

2.3.12 විනෝද බදු

---------------

සභා බල ප්‍රදේශයේ පිහිටි ගන්කන්ද සිනමා ශාලාව මඟින් 2013 වර්ෂය සඳහා රු. 30,058 ක විනෝද බදු ආදායමක් ලැබී තිබුණි. සභාව විසින් මුද්‍රා යෙදූ ප්‍රවේශ පත් අදාල ස්ථානයේදී අලෙවි කිරීමක් සිදු නොවන බවත්, සිනමා ශාලාව මඟින් විනෝද බදු අයකිරීම ඉතාමත් අක්‍රමවත්ව සිදුවන බවද නිරීක්ෂණය විය.

3. මෙහෙයුම් සමාලෝචනය
------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා
-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කසල ඉවත් කිරීම සඳහා කුළී පදනම මත ලබාගත් බැකෝ යන්ත්‍රයක් යොදා කුණු වලවල් කපා ඒ සඳහා ගෙවීම් කර තිබූ අතර, 2014 මාර්තු 27 දින භෞතික පරීක්ෂාවට ලක්කල දිනද, ඒ අයුරින්ම කුණු වලක් කපමින් පැවති නමුත් යන්ත්‍රයේ මනු කියවීමක් කර නොතිබුණි. තවද, සභාවේ නිළධාරියෙකුද එම ස්ථානයේ රඳවා නොතිබුණි. එබැවින් 2013 වර්ෂයේ දින 93 ක් සඳහා බැකෝ යන්ත්‍රයේ වැඩ පැය 297 ක් සඳහා ගෙවීම් කර තිබූ බවට වවුචර් පිළියෙල කර රු. 724,490 ක ගෙවීම් කර තිබීම විගණනයේදී ප්‍රශ්නකාරී විය.

(ආ) අංක පීඩී 7614 දරන කැබ් රථය 2013 මැයි 20 දින සිදුවූ අනතුරින් පසු පෞද්ගලික ආයතනයක් මඟින් රු. 589,759 ක් ගෙවා අළුත්වැඩියාවක් සිදුකර තිබුණි. රක්ෂණ වන්දි වශයෙන් රු. 561,532 ක් ප්‍රතිපූර්ණය කර තිබූ අතර රු. 28,227 ක් සභා අරමුදලින් දරා තිබුණි. අනතුරට වගකිවයුත්තන් හඳුනාගැනීමට කටයුතු කර නොමැති බැවින් සභා අරමුදලින් දරන ලද රු. 28,227 ක මුදල පිළිබඳ සෘජුවම සභා අරමුදලට වැයබරක් වී තිබුණි.

(ඇ) සභා බල ප්‍රදේශය තුල විශාල වශයෙන් ත්‍රීරෝද රථගාල් දක්නට ලැබූ නමුත් ඒ සඳහා පහසුකම් සලසා දීමෙන් අනතුරුව අතුරු ව්‍යවස්ථාවක් පනවා මාසික හෝ වාර්ෂික ආදායමක් ලබාගැනීමේ වැඩපිළිවෙලක් සභාව සතු නොවීය.

(ඈ) සභාවේ පාලනයේ පවතින පැල්මඩුල්ල හා පාතකඩ පුස්තකාල වල විගණිත දිනය වූ 2014 මාර්තු 26 දින වනවිට රු. 107,861 ක් වටිනාකමැති පොත් 1129 ක ඌනතාවයක් පවතින බව නිරීක්ෂණය විය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා
------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයතනය විසින් මිලදී ගනු ලබන හා භාවිතා කරනු ලබන පොදු ගබඩා තොග, පොදු ගබඩා ගිණුම මඟින් ගිණුම්ගත කිරීමට කටයුතු කර නොමැති අතර, මිලදීගනු ලබන අවස්ථාවන්හීදී වැය ශීර්ෂ හර කරමින් ගිණුම්ගත කිරීමට කටයුතු කර තිබුණි. ඒ අනුව වර්ෂය අවසානයට තොගය ගිණුම් මඟින් නිරීක්ෂණය නොවූ අතර, මිලදී ගනු ලබන සම්පූර්ණ තොගයම පරිභෝජනය කලාසේ සලකා ගිණුම්ගත කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි අංක 182(2), 187(3) හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ සාදන ලද 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 3 ප්‍රකාරව, සභාවට අයත් මාරපන උප කාර්යාලය මඟින් 2003 හා 2004 වර්ෂයන්ට අදාලව බැංකුගත වියයුතු රු. 8,915 ක මුදල් බැංකුගත නොවීම සම්බන්ධයෙන් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. එසේම 2004 වර්ෂයට අදාලව ගිණුම්ගත නොවූ රු. 517,448 ක මුදල් හා සෘජු ප්‍රේෂණ සම්බන්ධයෙන්ද විගණනයේදී දිගින් දිගටම පෙන්වා දී ඇතත් ඒ පිළිබඳවද කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බව නිරීක්ෂණය විය.

(ඇ) සභාවේ සේවයේ නියුතුව සිටි කාර්යය මණ්ඩලය වෙත නිකුත් කල රු. 149,133 ක්වූ හිඟ සේවක ණය ශේෂයක් විගණිත දින වනවිටද අයකරගෙන නොතිබුණි.

3.3 මතභේදයට තුඩුදුන් ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාවට අයත් අංක පීඩී 7614 දරන කැබ් රථය සඳහා ධාවන සටහන් වල මයිලෝමීටරයෙහි සඳහන් කිලෝමීටර් ගණන ඇතුලත් නොකර රියදුරුගේ ස්ව තක්සේරුව මත ඉන්ධන තුලනය කිරීම සිදුකර තිබුණි. එසේම මාස 03 කට වරක්වත් ඉන්ධන දහනය පරීක්ෂාව සිදුකල යුතු වුවත්, 2013 වර්ෂය මුළුල්ලේම සිදුකර නොතිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී මිලදී ගන්නා ලද රු. 624,041 ක් වටිනාකමැති ඉන්ධන ලීටර් 5199 ක් ලබාගෙන ඇත්තේ සත්‍ය අවශ්‍යතාවය වෙනුවෙන්ද යන්න පිළිබඳව විගණනයේදී තහවුරු නොවුණි.

(ආ) 2013 පෙබරවාරි 26 දින සිට 2013 මාර්තු 03 දින දක්වා තායිලන්ත සංචාරය සඳහා සභිකයින් සයදෙනෙකුට රු. 540,000 ක වියදමක් සභා අරමුදලින් වියදම් කර තිබුණි.
මේ සඳහා පළාත් පාලන විෂයයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබී ඇති බව සබරගමුව පළාත් පාලන කොමසාරිස්වරයාගේ අංක සීඑල්ජී/436(1) හා 2013 පෙබරවාරි 13 දිනැති ලිපිය මඟින් දැනුම් දී තිබුණි.
මෙම සංචාරය සම්බන්ධයෙන් තවදුරටත් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) විදේශ පුහුණු වැඩසටහන පිළිබඳ තොරතුරු වාර්තා වී නොතිබුණි.

(ii) පළාත් පාලන ආයතන වල අරමුදල් රාජ්‍ය ප්‍රතිපත්ති වලට පටහැනි වන අන්දමින් නොයෙදිය යුතු බවත්, "පළාත් පාලන ප්‍රධානියෙකු, නියෝජිතයෙකු හෝ සභිකයෙකු විදේශ පුහුණු වැඩසටහන් සඳහා තෝරා ගන්නේ නම් අදාල සංවිධානය හෝ විදේශ රජය හෝ විදේශ ආයතනය හෝ ඒ සඳහා වැයවන සියළු වියදම් සහ පහසුකම් දැරිය යුතු" බවට පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශ ලේකම් විසින් දිවයිනේ සියළු ප්‍රධාන ලේකම්වරුන්ට උපදෙස් ලබා දී තිබුණද, ඒ පිළිබඳව අවධානය යොමුකර නොතිබුණි.

(iii) විදේශ පුහුණුව මඟින් ලබාගත් දැනුම දේශීය වශයෙන් උපයෝගී කරගන්නා ආකාරය පිළිබඳව වාර්තාවක් පුහුණුව අවසන් වී මාසයක් ඇතුලත ලබා දීමද සිදුකර නොතිබුණි

(iv) විදේශ සංචාරය සඳහා සහභාගී වන අය රටින් බැහැර යාම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අවසරය ලබා ගතයුතු වුවද එකී අවසරය ලබා ගෙන නොතිබුණි. තවද, එතරදී දරනු ලබන ගමන් වියදම්, ගුවන් තොටුපල ගාස්තු, වීසා ගාස්තු යනාදිය පියවා ගැනීම සඳහා එක් දිනකට ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 50 බැගින් උපරිම දින 15 සඳහා ගෙවිය හැකි වුවද, තායිලන්ත සංචාරය සඳහා වියදම් ලෙස පුද්ගලික ආයතනයක් වෙත සමාලෝචිත වර්ෂය තුලදී රු. 540,000 ක් සභා අරමුදලින් ගෙවා තිබියදී, නැවත සභිකයින් හය දෙනෙකු සඳහා එක් සභිකයෙකුට දිනකට ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 50 බැගින් ඩොලර් 300 ක්, එකතුව ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 1800 ක් එනම්, ශ්‍රී ලංකා රු. 230,382 ක් සභා අරමුදලින් වැය කර තිබුණි.

3.4 කොන්ත්‍රාත් පරිපාලනය

(අ) කෙහෙල්බද්දර ඇල හරහා පැති බැම් පාලමක් ඉදිකිරීමට අදාලව හා ගෝණකුඹුර සමෘද්ධි සමිතිය සමඟ 2011 දෙසැම්බර් 22 දින රු. 883,743 ක් සහ 2012 පෙබරවාරි 22 දින දෙවන වරට රු. 419,231 ක වටිනාකමින් යුත් ගිවිසුම් 02 කට එළඹ තිබුණි. උක්ත ගිවිසුම් ප්‍රකාරව ඉදිකිරීම් සතුටුදායක ලෙස නිම කල බවට වූ කාර්මික නිළධාරීගේ නිර්දේශ මත රඳවුම් මුදල් අඩු කිරීමෙන් පසු 2012 වර්ෂය තුල අවස්ථා 02 කදී රු. 836,667 ක් ගෙවීම් කර තිබුණි.

තවද, මෙම ඉදිකිරීමට අදාල රැඳවුම් මුදල් හා ගිවිසුම් ඇප ලෙස රු. 158,113 ක මුදලක් අදාල සමිතිය වෙත නිදහස් කර තිබුණි.

මෙම පාලම ජල මාර්ගය හරහා බැම්මක් බැඳ හියුම් පයිප්ප යොදා ගනිමින් ඉදිකර තිබූ අතර, ජල දහරාවට ගලායෑම සඳහා යොදා ඇති හියුම් පයිප්ප ප්‍රමාණවත් නොවීමත්, ජලය සමඟ ගසාගෙන එනු ලබන දැව කොටස් ආදිය මඟින් හියුම් පයිප්ප අවහිර වීමත්, ස්වභාවික ජල මාර්ගය හරහා ඉදිකල බැම්ම මඟින් ජල මාර්ගය අවහිර වීමත් හේතුවෙන්, එම ස්ථානයේ ඇති වූ ජල පීඩනය නිසා ජල ප්‍රවාහයේ ස්වභාවික ගමන්මඟ වෙනස් වී ඉදිකල පාලම සමඟ ඇල මාර්ගයේ ඉවුරු බිඳීගොස් අසල ඉඩමක් හරහා ජලය බැස යාමෙන් විශාල පරිසර හානියකටද ලක්ව තිබූ  බව 2014 මාර්තු 27 දින කරන ලද භෞතික පරීක්ෂාවේදි අනාවරණය විය.

(ආ) ප්‍රාදේශීය සභාවේ පරිසර සංරක්ෂණ (කසල කළමනාකරණ) මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා පළමු අදියර වශයෙන් රු. 8,357,103 ක මුදලක් අනුමත කර තිබුණි. උක්ත කර්මාන්තය සඳහා මිල ගණන් කැඳවා තෝරාගත් කොනත්‍රාත්කරු විසින් ගිවිසුම පරිදි කටයුතු නොකර කොන්ත්‍රාත්තුව පැහැර හැර ඇති බැවින් එම කොන්ත්‍රාත්කරු සමඟ ඇති කරගත් ගිවිසුම අවලංගු කර කොන්ත්‍රාත්තුව සභාව වෙත පැවරීමට ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කර රු. 8,357,102 ක වැඩ වියදමක් මත කොන්ත්‍රාත්තුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුගමනය කරමින් 2012 දෙසැම්බර් 15 දිනට පෙර නිම කිරීමට අංක සීඑම්/ඩීඊ/03 හා 2012 ඔක්තෝබර් 08 දිනැති ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය මඟින් දැනුම්දී තිබුණි.

නමුත් 2012 ඔක්තෝබර් 12 දින සභාව විසින් ගෙනඇති තීරණයක් පරිදි ඉදිකිරීම් කටයුතු සීමිත මිල ගණන් කැඳවා සිදු කිරීමට පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබා දී තිබුණි. සීමිත මිල ගණන් මත මිල ගණන් කැඳවා පුද්ගලික කොන්ත්‍රාත් කරුවෙකුට කොන්ත්‍රාත්තුව පවරා මාස 06 ක් ඇතුලත වැඩ නිමකර භාර දීම සඳහා 2012 නොවැම්බර් 22 දින ගිවිසුම්ගත වී තිබූ නමුත් 2014 මාර්තු 27 දින සභාවේ නිළධාරීන් සමඟ විගණන නිළධාරීන් විසින් සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී කසල කළමනාකරණ මධ්‍යස්ථානයේ වැඩ අවසන් කර නොතිබුණි.

(ඇ) කසල කළමනාකරණ ව්‍යාපෘතිය ඉදිකිරීම වෙනුවෙන් තාක්ෂණික නිළධාරීගේ නිර්දේශ මත පිළියෙල කරන ලද රු. 5,929,590 ක බිල්පත් 2014 මාර්තු 27 දින වනවිටත් ප්‍රධාන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබුණද, රු. 4,843,575 ක් ගෙවීම් කර තිබූ අතර, ඉන් අනතුරුව කොන්ත්‍රාත්තුවේ වැඩ නතර වී තිබුණි. එකතුව රු. 1,031,402 ක වියදමින් ඉදිකිරීමට යෝජිත සේවක විවේකාගාරය හා මුරකුටිය වැඩ බොහෝ දුරට අවසන් කර ඇති බව නිරීක්ෂණය වූ නමුත් රු. 425,471 ක වියදමින් ඉදිකිරීමට යෝජිත කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම් කිසිවක් සිදුකර නොමැති බව නිරීක්ෂණය විය.

3.5 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

---------------------------------

රු. 4,843,575 ක වියදමක් දරා කසල කළමනාකරණ මධ්‍යස්ථානයේ කොටසක් ඉදිකර තිබූ අතර, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයයේ ඉවතලන කුණු කසලද මෙම පරිශ්‍රයට ගෙනවිත් ගොඩගසා දුගඳ හමමින් තිබුණි. මීට අමතරව මෙම ස්ථනයේ 2013 වර්ෂය තුලදී රු. 724,490 ක වියදම් දරා බැකෝ යන්ත්‍රයක් මඟින් කුණු වලවල් කපා කුණු වළදැමීම සිදුකර තිබුණි.ඉදිකරමින් පවතින ගොඩනැගිලි පරිශ්‍රය වල් බිහිවෙමින් පැවතින බවත්,ඉදිකරමින් පවතින ටැංකි 02 ක අපවිත්‍ර ජලය පිරී දුගඳ හමමින් තිබූ බවත්, ඩෙංගු වැනි මැසි මදුරුවන්ගෙන් පැතිරිය හැකි බෝවන රෝග පැතිරීමේ ඉඩප්‍රස්ථාව පවතින බවත්, කොන්ක්‍රීට් අංගනය ඉදිකරනු ලබන පරිශ්‍රයේද අවට කුණු කසල ගෙනවිත් ගොඩගසා තිබූ බවත්, කුණු කසල සතුන් විසින් ඇඳ දමා ප්‍රදේශය අපවිත්‍ර වී දැඩි දුගඳක් හමමින් පැවතිණ බවත්,කුණු කසල කුණු වලකට දමා වසා දැමීම සිදුකරන බැවින් දිරන හා නොදිරන සියළු අපද්‍රව්‍ය වළදැමීම සිදුවී නොදිරන

අපද්‍රව්‍ය භූගත වීම තුල ප්‍රබල පරිසර හානියක් සිදුවන බවත් 2014 මාර්තු 27 සිදු කරන ලද භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය

------------------------

1988 ( ප්‍රාදේශීය සභා) මූල්‍ය පරිපාලන රීතී මාලාවේ 5(7) ප්‍රකාරව මූල්‍ය හා ගබඩා සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වා නොතිබුණි.

4.2 අයවැය පාලනය

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පානීය ජල ව්‍යාපෘතිය (මාරපන රජනාඇල්ල, කිරිදිඇල්ල) හා නව වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා රු. 1,000,000 ක් හා රු. 55,000,000 බැගින් එකතුව රු. 56,000,000 ප්‍රතිපාදන සලසා ගෙන තිබූ නමුත්, අදාල ව්‍යාපෘති සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට හෝ සැලසුම් කිරීමට අපොහොසත් වී තිබුණි.

(ඈ) වැය විෂයයන් 17 කට අදාලව සලසා තිබූ ප්‍රතිපාදන වලින් රු. 8,349,873 ක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය අවසානයේදී උපයෝජනයට ගෙන නොතිබුණි.

5. පද්ධති හා පාලන

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) කොන්ත්‍රාත් පාලනය

(ඉ) කසල කළමනාකරණය